"ජලය මානව හිමිකමකි - සුවරැකුම අභිමානයකි"

# ජල සම්පාදන අමාත්‍යාංශය

## ලෝක බැංකුව විසින් සහාය සපයනු ලබන, ජල සම්පාදන හා සනීපාරක්ෂක වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP)

**ණය අංකය : Cr 5685-LK**

## ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කණ්ඩායම සඳහා පුරප්පාඩු

ලෝක බැංකුව විසින් සහාය සපයනු ලබන ජල සම්පාදන හා සනීපාරක්ෂක වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP) ජාතික ජල අවශ්‍යතා ලබාදෙන ආයතනවල, ධාරිතාව වැඩිදියුණුකර සංවර්ධනය කරලීම සහ මුලතිව්, කිලිනොච්චි, නුවරඑළිය, කෑගල්ල, රත්නපුර, බදුල්ල සහ මොනරාගල දිස්ත්‍රික්කවල සනීපාරක්ෂකතාව පිළිබඳ පහසුකම් වැඩි වර්ධනය (දියුණු) කරලීම හා නළගත ජල පහසුකම් සේවාවලට ඇති ප්‍රවේශ්‍යය / ප්‍රවේශය වැඩිදියුණු කරලීම සඳහා සැලසුම්කර නිර්මාණය කරනලද ව්‍යාපෘතියකි.

ජලසම්පාදන යෝජනා ක්‍රම සහ සනීපාරක්ෂක ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු දැනටමත් ආරම්භ කර ඇති අතර, ව්‍යාපෘතිය, එහි 5 වන වසරේ පසුවන අතර, එහි කාර්ය කටයුතුවලින් 77% ක් වන ප්‍රමාණයක් නිමාකර සම්පූර්ණ කර ඇත.

මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, කොළඹ පිහිටුවා ඇති අතර, දිස්ත්‍රික්ක සහාය ඒකක එක එකක් බැගින් එක් එක් දිස්ත්‍රික්කවල පිහිටුවා ඇත. මුළු ව්‍යාපෘති පිරිවැය ඇමරිකන් ඩොලර් මිලියන 183 ක් වනු ඇත.

පහත සඳහන් පුරප්පාඩු සඳහා ලාංකීය පුරවැසියන් වෙතින් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් සතුව පහත සඳහන් අවම සුදුසුකම් තිබිය යුතුය.

### ඉංජිනේරු සහකාර තනතුර (PS6)

**සේවා ස්ථානය :**

දිස්ත්‍රික් ආධාරක ඒකක

**සුදුසුකම් හා පළපුරුද්ද :**

01. තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, තෘතීයික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (සුදුසුකම්) හි 7 මට්ටමට නොඅඩු නිපුණතා / ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

අවම තරමින් වසර 3 ක පළපුරුද්ද

හෝ

02. තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (සුදුසුකම්) 6 මට්ටමට නොඅඩු ප්‍රවීණතා / නිපුණතා සහතිකයක් ලබා තිබීම

සහ

අවම තරමින් වසර 08 ක පළපුරුද්ද

හෝ

03. තෘතීයික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා, තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරන ලද, ජාතික වෘත්තීය කුසලතා 5 මට්ටමට නොඅඩු ප්‍රවීණතා / නිපුණතා සහතිකයක් ලබා තිබීම.

සහ

අවම තරමින් වසර 13 ක පළපුරුද්ද.

ජල සම්පාදන හා සනීපාරක්ෂක කටයුතුවලට අදාළ ක්‍රියාකාරකම්වල පළපුරුද්දක් සහිතවීම අමතර සුදුසුකමක් වනු ඇත.

### ඉහත සඳහන් තනතුර සඳහා පොදු කොන්දේසි :

**වයස් සීමාව :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 64 ට අඩු විය යුතුය.

**වැටුප් පරිමාණය :**

වැටුප, 2019/01 දරන (MSC) කළමනාකරණ සේවා චක්‍රලේඛය මත පදනම්ව ගෙවනු ලැබේ.

**සේවා කොන්දේසි හා නියමයන් :**

පත්වීම, සතුටුදායක කාර්ය සාධන ඇගයීම් ක්ෂේත්‍රවලට යටත්ව තැවත අලුත්කරගත හැකිය. මූලික වශයෙන් එක් වසරක කාලසීමාවක් සඳහා වන කොන්ත්‍රාත්තුවේ පදනම මත වනු ඇත. පත්වීමට අදාලව වන සියලු කොන්දේසි 2019/01 අංකය දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ කොන්දේසි හා නියමයන්ට අදාලවනු ඇත.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :**

ඉහලම සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා, එම සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කාර්ය සාධනය මත තෝරාගනු ලබනු ඇත.

සියලු ජීවදත්ත තොරතුරු පත්‍රය (CV) සහිත අයදුම්පත්, අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද හා පෙර සේවාවන් පිළිබඳ සහතික පත්‍රවල පිටපත්ද සමග 2020 ඔක්තෝබර් මස 18 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි (ලේඛනගත) තැපෑලෙන් එවිය යුතුය.

"අයදුම් කරනු ලබන තනතුර ලිපිකවරයේ වම්පස ඉහළ කෙලවරේ පැහැදිලිව සටහන් කළ යුතුය. රාජ්‍ය / ආයතනික අංශයේ ආයතන / සංවිධාන වල සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ ආයතන / සංවිධානවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ජලසම්පාදන හා සනීපාරක්ෂකතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP)**
**අංක 230, E.W. පෙරේරා මාවත,**
**ජුබිලි කණුව, නුගේගොඩ.**

Source: Dinamina, Daily News (2020.10.02)